# මේ පින්කමට එක්වෙමු........ 'සීල සුව අරණ'

සර්දා උදේනි විජයතිලක

සීල වන්ත, ගුණවන්ත, පින්කෙතක් බදු වූ පූජනීය මහා සංඝරත්නය රෝගීව ගිලන් වූ කල උන්වහන්සේලාට අවශ්‍ය වෛද්‍ය ප්‍රතිකාර, ඇප උපස්ථාන කටයුතු සිදුකරමින් කරුණාවෙන් රැක බලා ගන්නා රමණීය ආරණ්‍යයක් බදු පිං බිම 'සීල සුව අරණ'යි. පූජ්‍ය ගලිගමුවේ ඥාණදීප හිමියන්ගේ සංකල්පයක් මත ගිලන් භික්ෂූන්වහන්සේලා උදෙසා මෙවැනි පිං බිමක් ආරම්භ කිරීම පිණිස හොරණ දික්හේන පුර ප්‍රදේශයේ අනුර ගමගේ මැතිතුමා විසින් පූජා කරන ලද භූමිය, සැදැහවත් බැතිමතුන්ගෙන් ලැබුණු මූල්‍යමය සහ ශ්‍රම ආධාර මත ඉතා මහන්සි වී එම ගොඩනැගිල්ලේ වැඩ නිමවා භික්ෂූන්වහන්සේලා ඇතුළත් කර ගැනීම 2015 ජූනි මස 31වන දින විවෘත කිරීමත් සමගම සිදුකරන්නට යෙදුනි.

ගිලන් භික්ෂූන්වහන්සේලා 15නමක් පළමු දිනයේම ඇතුළත් කරනු ලැබීය. මේ වන විට ගිලන් භික්ෂූන්වහන්සේලා 25 නමක් පමණ නේවාසිකව ඇප උපස්ථාන ලබමින් ප්‍රතිකාර ලබති.

මේ භික්සුන් වහන්සේලා රෝග සුවවීමෙන් පසුව ද රැගෙන යාමට භාරකරුවෙක් නොමැති වීම නිසා අපවත්වන තුරුම රැකබලා ගැනීමට ගලිගමුවේ ඥාණදීප හිමියෝ කටයුතු කරති.

විට මේ පිං බිමට ලඟා විය හැකිය. සංඝ සේවාවේ වටිනාකම හොඳින් දන්න පින්වත් ඔබටත් ගලිගමුවේ ඥාණදීප ස්වාමීන්වහන්සේ විසින් ආරම්භ කරන ලද මේ පුණ්‍ය සේවාවට දායක වීමට අවස්ථාව ලැබී ඇත.

ඒ ගිලන් භික්ෂු ප්‍රතිකාර මධ්‍යස්ථානයේ වැඩ සිටින භික්ෂූන්වහන්සේලාට අවශ්‍ය කරන වෛද්‍ය පහසුකම්, බෙහෙත් ද්‍රව්‍යමය වියදම්, වෛද්‍ය පර්යේෂණ කටයුතු, සාත්තු සේවක වියදම්, හදිසි ශල්‍යකර්ම වියදම්, ගොඩනැගිලි වියදම් සහ රෝහල්ගත කිරීම් ආදිය සඳහා මූල්‍යමය ආධාර ලබා දීමට ආධාර පිණිස පැවැත්වෙන ආහාර පොළට සහභාගී වීමෙන් ඔබටත් මෙම මහඟු පුණ්‍යකර්මයට දායක විය හැකිය.

පසුගිය වසරේ මෙල්බර්න් වාසි පින්වත් ඔබ සැමගේ සහභාගීත්වයෙන් පැවැත් වූ ආහාර පොළෙන් උපයාගන්නා ලද ඩොලර් 25ල000ග00 ක වාර්ථාගත මුදල අද වන විට ඉතා ප්‍රයෝජනවත් ආකාරයෙන් ක්‍රියාත්මකව පවතී.



පූජ්‍ය ගලිගමුවේ ඥාණදීප ස්වාමීන්වහන්සේ විසින් බෙරික් ශාක්‍යමුනි සම්බුද්ධ විහාරය, කීස්බරෝ ධම්මසරණ විහාරය, රොක්බෑන්ක් පාරමිතා බෞද්ධ විහාරය සහ යුරෝක් දහම් නිකේතනය ආශ්‍රිතව ධර්ම දේශනා මාලාවක් පැවැත්වීමට ද කටයුතු යොදා ඇත.

'සීල සුව අරණ' පිළිබඳ ඔබට තවත් වැඩි විස්තර අවශ්‍ය නම් පූජ්‍ය ගලිගමුවේ ඥාණදීප හිමියන්ගේ දුරකථනයන් 94115753987 හෝ¸94718671086* ඇමතීමෙන් ලබා ගත හැකිය.

මෙම පුණ්‍යකර්මයට දායක වීම පින්වත් ඔබට සසර දුකින් මිදීමට පාරමිතාවක් ම වේවා යැයි අපගේ පැතුමයි.......!






Sardha Udeni Wijayatilaka - Skye

රෝගී තත්වයන් මත වෙන වෙනම ම ආහාර පිළියෙළ කිරීම ද, පලපුරුදු රෝහල් කාර්ය මණ්ඩලය යොදවා රෝගී භික්ෂූන්වහන්සේලා හට වෛද්‍ය ප්‍රතිකාර, බෙහෙත් කලට වේලාවට ලබා දීම, පිරිසිදු කිරීමේ කටයුතු, මළ මූත්‍රා අස්කිරීම, සිවුරු ඇඳ ඇතිරිලි දිනපතා තම්බා සේදීම, ආදී ඉතා වෙහෙසකර ඇප උපස්ථාන කටයුතු දිවා රාත්‍රී දෙකේම සිදු කරයි.

වෛද්‍ය ප්‍රතිකාර පමණක් නොව, උදෑසන බුද්ධ වන්දනා කටයුතු , දවස පුරා ධර්ම ශ්‍රවනයට පහසුකම් සපයා තිබීම, ගිලන් භික්ෂූන්වහන්සේලා සමඟ කරන සවස ගිලන්පස බුද්ධ වන්දනාවන් ආදි ආගමික පිළිවෙත් සමඟ ගිලන් භික්ෂූන්වහන්සේලාගේ අධ්‍යාත්මික සුවතාවය පිණිස කටයුතු රැසක් 'සීල සුව අරණ' තුළින් සිදු කරයි.

ඉදිරි වසර කිහිපය තුල ආයුර්වේද ප්‍රතිකාර ඒකකයක්, සහ ගිලන් භික්ෂූන්වහන්සේලා සිය නමකට පමණ නේවාසිකව ප්‍රතිකාර ලබා ගත හැකි අංගසම්පූර්ණ වෛද්‍ය ප්‍රතිකාර මධ්‍යස්ථානයක් බවට පියවරෙන් පියවර 'සීල සුව අරණ' පත් කිරීම පූජ්‍ය ගලිගමුවේ ඥාණදීප හිමියන්ගේ අදහසයි.

හොරණ සිට පාදුක්ක පාරේ කිලෝමීටර 2 ක් පමණ ගොස් දික්හේන පුර පාරේ (දකුණට හැරී) නැවතත් කිලෝමීටර 2 ක් පමණ ගිය




